පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
පොලිස් මූලස්ථානය, කොළඹ 01


තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No } 10120

ෆැක්ස් / தொலைநகல / Fax } 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone } 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site } www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail } dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO } 377/2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No } / 2024

දිනය / திகதி / Date } 03/03/2024

පැය 1425

**මාධ්‍ය නිවේදනය**

**පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු**

**01. 2024.03.02 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරීන් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාර්තාව පහත පරිදි වේ.**

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) | ගෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|---|
| 02 | 02 | 43 | 82 | යකඩ බැරල් 01<br>තඹ දඟර 01 |

වැටලීම් සිදු කර අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් හා දේපල අදාළ පොලිස් ස්ථාන වෙත ඉදිරිපත් කර ඇත.

**02. පුරා වස්තු සෙවීමේ අදහසින් කැණීම් කරමින් සිටි සැකකරුවන් දෙදෙනකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා අළුත්ගම කඳවුර**

2024.03.02 වන දින අළුයම් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා අළුත්ගම කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැලිපැන්න පොලිස් වසමේ වලගෙදර ප්‍රදේශයේ වැටලීමක් සිදු කර පුරා වස්තු සෙවීමේ අදහසින් කැණීම් කරමින් සිටි සැකකරුවන් දෙදෙනකු අත්අඩංගුවට ගෙන වැලිපැන්න පොලිස් ස්ථානය වෙත භාරදී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් වයස අවුරුදු 27 ක් හා 45 ක් වන අගලවත්ත ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

වැලිපැන්න පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**03. බලපත්‍ර කොන්දේසි උල්ලංඝණය කරමින් ටිපර් රථයකින් වැලි ප්‍රවාහනය කල සැකකරුවකු අත් අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා කල්ලඩි කඳවුර.**

2024.03.02 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා කල්අඩි කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත කරදියනාරු පොලිස් වසමේ වෙප්පුවට්ටුවාන් ප්‍රදේශයේ වැටලීමක් සිදු කර බලපත්‍ර කොන්දේසි උල්ලංඝණය කරමින් ටිපර් රථයකින් වැලි ප්‍රවාහනය කල සැකකරුවකු අත් අඩංගුවට ගෙන කරදියනාරු පොලිස් ස්ථානය වෙත භාර දී ඇත

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 30 ක් වූ මඩකලපුව ප්‍රදේශයේ** පදිංචිකරුවකු වේ.

කරදියනාරු පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**04. බලපත්‍ර කොන්දේසි උල්ලංඝණය කරමින් වැලි කැණීම් කර බෝට්ටුවකට පටවමින් සිටි සැකකරුවන් දෙදෙනෙකු අත් අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා අරලගංවිල කඳවුර .**

2024.03.02 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා අරලගංවිල කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරකට අනුව වැලිකන්ද පොලිස් වසමේ මොණරතැන්න ප්‍රදේශයේ වැටලීමක් සිදුකර බලපත්‍ර කොන්දේසි උල්ලංඝණය කරමින් වැලි කැණීම් කර බෝට්ටුවකට පටවමින් සිටි සැකකරුවන් දෙදෙනෙකු අත් අඩංගුවට ගෙන වැලිකන්ද පොලිස් ස්ථානයට භාරදී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 42 සහ 34 යන වයස් වල පසුවන වැලිකන්ද සහ සෙවනපිටිය** ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.

වැලිකන්ද පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**05. බලපත්‍ර නීති උල්ලංඝනය කරමින් පතල් කැණීම් කරමින් සිටි සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා පස්සර කඳවුර.**

2024.03.02 වන දින දහවල් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා පස්සර කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත පස්සර පොලිස් වසමේ දෙල්ගොල්ල ඉවුර ආශ්‍රිත ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර බලපත්‍ර නීති උල්ලංඝනය කරමින් පතල් කැණීම් කරමින් සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන වැඩිදුර විමර්ශන සඳහා බදුල්ල ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය වෙත භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 28ක් වන පස්සර** ප්‍රදේශයේ පදිංචිකරුවකු වේ.

**06. මෙරට නිෂ්පාදිත ගිනි අවිය දෙකක් සමඟ සැකකරුවන් දෙදෙනකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා දඹුල්ල කඳවුර.**

2024.03.02 වන දින උදෑසන කාලයේ සීගිරිය පොලිස් වසමේ කුඹුක්කදන්වල ප්‍රදේශයේ දී පොලිස් විශේෂ කාර්ය බලකා දඹුල්ල කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර මෙරට නිෂ්පාදිත ගිනි අවි දෙකක් සමඟ සැකකරුවන් දෙදෙනකු අත්අඩංගුවට ගෙන සීගිරිය පොලිස් ස්ථානයට භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් වයස අවුරුදු 60ක් හා 70 ක් වන කිඹිස්ස ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.සීගිරිය** පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය
පොලිස් මාධ්‍ය කොට්ඨාසය.